# මෙත් සවිය



මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

METH SAVIYA NEWS LETTER

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්‍රිකා පාර, කොළඹ 06

දුක: 071 4014467 / 0112 505088 වෙබ් අඩවිය: www.methsaviya.lk විද්‍යුත් තැපෑල: methoffice@gmail.com

• සාමාජිකයන් සඳහා තොරතුරු පත්‍රිකාව • 2013 ජූනි • මෙත්සවිය එකොළොස්වන කාණ්ඩය • 21 වන කලාපය

නිතින් මෙත් සිතින් මම් වෙසෙම් වා
ගතින් මෙන් සිතින් රෝ මුදම් වා
බැතින් තුන් රුවන් ඔප් නගම් වා
මෙතින් නෙත් පියම් වා නිවෙම් වා

# මෙත් සවිය

## දසවන සංවත්සරය

## නිමිත්තෙන්....



අතිපූජ්‍ය තිබ්බටුවාවේ
ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන
මහානායක මහ හිමිපාණන් වහන්සේ,
මහනුවර උපෝෂිත,
පුෂ්පාරාම විහාරද්වයාධිපති
මහා විහාර වංශික ස්‍යාමෝපාලි
මහා නිකායේ
මහා නායක ස්ථවිර,
මල්වතු මහා විහාරය, මහනුවර.

**මහා විහාර වංශික ස්‍යාමොපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ අතිපූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහානායක මහා හිමිපාණන් වහන්සේගේ පණිවුඩය**

ශ්‍රී සම්බුද්ධ සාසනයේ චිර පැවැත්ම සහ අභිවෘද්ධිය ඇතිකර ලීමේ අරමුණින් මහාචාර්ය චන්දන ජයරත්න මැතිඳුන්ගේ මූලිකත්වයෙන්, වැල්ලවත්ත ශ්‍රී විජයාරාම විහාරස්ථානය කේන්ද්‍රකොට පිහිටුවා ගෙන ඇති 'මෙත් සවිය' සංවිධානයට දස වර්ෂයක් සම්පූර්ණ වීම නිමිති කොට පළ කෙරෙන සමරු කලාපයට සුභාශිංසන පණිවුඩයක් ලබාදීමට හැකිවීම අගය කොට සලකමි. 'මෙත් සවිය' සංවිධානය මගින් ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින ශ්‍රාවකයින් දහස් ගණනකට යහපත් ජීවිතයකට හරවත් මග පෙන්වීමක් සිදු කෙරෙන අතර, බෞද්ධ සිද්ධස්ථාන සංවර්ධනයට හා බෞද්ධ ජනතාවගේ සුබ සාධනයට අදාල වන සත්කාර සේවා රැසක් ඉටුකරන බව දැනගන්නට ලැබීම සතුටට කරුණකි. ත්‍රිවිධ රත්නයේ සහ දළදා වහන්සේගේ ආශිර්වාදයෙන් මහාචාර්ය චන්දන ජයරත්න මහතා ප්‍රමුඛ මෙත් සවිය සංවිධනයේ සැම සියලු දෙනාට සම්බුදු සසුනේ සහ බෞද්ධ ජනතාවගේ අභිවර්ධනය උදෙසා තවදුරටත් යහපත් සත්කාර සේවා ඉටු කිරීමට ශක්තිය ලැබේවා යි කරුණාධ්‍යාසයෙන් ආශිංසනය කරමිහ.

---



ස්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි
පාර්ශ්වයේ මහානායක ධූරන්ධර
අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය උඩුගම
සද්ධර්ම කීර්ති ශ්‍රී ධම්මදස්සි රතනපාල
බුද්ධරක්ඛිතාභිධාන මහානායක
ස්වාමින් වහන්සේ

**ස්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි පාර්ශ්වයේ මහානායක ධූරන්ධර අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය උඩුගම සද්ධර්ම කීර්ති ශ්‍රී ධම්මදස්සි රතනපාල බුද්ධරක්ඛිතාභිධාන මහානායක මහා හිමිපාණන් වහන්සේගේ පණිවුඩය**

ගරු අධිකරණ සංඝනායක අහංගම ආනන්ද ස්වාමින් වහන්සේගේ අනුශාසකත්වයෙන් වැල්ලවත්ත ශ්‍රී විජයාරාම විහාරස්ථානය කේන්ද්‍ර කරගෙන පවත්වාගෙන යනු ලබන 'මෙත් සවිය මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය' තුළින් පුරා දශකයකට අධික කාලයක් විශාල සේවාවක් පොදු මහජනතාවට මෙන් ම දිවයින පුරා ස්ථාපිත වෙහෙර විහාරස්ථානවලටත් ඉටු කරන ප්‍රමුඛ පෙළේ ආගමික සංවිධානයකි. අද සමාජය තුළ දිනෙන් දින වර්ධනය වන අමානුෂික සිදුවීම් යම්තාක් දුරකට හෝ පාලනය කිරීමටත් පුද්ගලයාගේ අධ්‍යාත්මික සංවර්ධනයටත් රුකුලක් වන්නේ 'භාවනාවයි'. මෙත් සවිය සංවිධානය අඛණ්ඩව දශකයක් පුරා මෙම කාර්යය ඉතාමත් සැලසුම් සහගත ලෙස ඉටුකරමින් සිටියි. පුද්ගල අධ්‍යාත්මික සංවර්ධනය මෙන් ම විවිධාකාර වූ ආගමික, සාමාජික සත්කාරක සේවාවන් රාශියක් මෙම සංවිධානය මගින් කරගෙන යන අතර ඒවායින් කිහිපයක් ඔබගේ සිහිගැන්වීම පිණිස පහතින් සඳහන් කරමි.

''මිරිසවැටිය සලපතල මළුව ප්‍රතිසංස්කරණය කිරීම ආරම්භ කිරීම, නාගදීපය සහ කිලිනොච්චියේ ලුම්බිණි විහාරයේ නාගදීප වන්දනාවේ යන බැතිමතුන්ගේ පහසුව සඳහා වැසිකිළි පද්ධතීන් සාදා නිමකොට පූජා කිරීම, මහියංගණ රජමහා විහාරස්ථානයේ ලක්‍ෂයකට වැඩි පිරිසකට එකවර ජලය පානය කළ හැකි ජල පිරිපහදුවක් සාදා පූජා කිරීම, 2550 බුද්ධ ජයන්ති සැමරුම වෙනුවෙන් සත්ත්ව හිංසනය පිටුදැකීමේ නීති මාලාවක් සකසන මෙන් අත්සන් ලක්‍ෂයකින් යුතු ආයාචනයක් මගින් රජයෙන් ඉල්ලා සිටීම, රිජ්වේ ආර්යා ළමා රෝහල, මහරගම පිළිකා රෝහල, කොළඹ ජාතික රෝහල හා අංගොඩ මානසික රෝහල ඇතුළු රෝහල් ගණනාවකට අවශ්‍ය උපකරණ ලබාදීම. ''

ඉහත සඳහන් කරන ලද විශිෂ්ට සේවාවන් අතර බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමන සිහි කරනු වස් ඓතිහාසික මහියංගණය පූජා භූමිය තුළ ඉදිවෙමින් පවතින අඩි 84 ක් උසැති අලංකාර සම්බුද්ධ ප්‍රතිමා වහන්සේ තුළින් තවදුරටත් සකල ලෝකවාසී බෞද්ධ ජනතාවගේ නිරාමිස බුද්ධාලම්භන ප්‍රීතිය වර්ධනය වීමට රුකුලක් වේ. මෙවන් කර්තව්‍ය තව චිරාත් කාලයක් කිරීමට, යෝධ බල, යෝධ ශක්තිය හා තුණුරුවන් සතු අනන්ත ආශිර්වාද බලය මහාචාර්ය චන්දන ජයරත්නයන්ටත් මෙත් සවිය නිලධාරී මණ්ඩලයට හා සියලුම සාමාජික සාමාජිකාවන්ටත් ලැබේවායි මාගේ පැතුමයි !

**මෙත් සවිය**

**මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය**

2013 ජුනි / එකොළොස්වන කාණ්ඩය

21 වන කලාපය

**ගරු පැවිදි අනුශාසක**

අමරපුර නිකායේ අධිකරණ
සංඝ නායක අතිපූජ්‍ය
අහංගම ආනන්ද
ස්වාමීන් වහන්සේ

**ගරු ගිහි අනුශාසක**

සරත් ඉලංගන්තිලක මහතා
තුසිත දොඹගොඩ මහතා

**ගරු සභාපති**

විද්‍යා කීර්ති මහාචාර්ය
චන්දන ජයරත්න මහතා
දූ.කඃ 0714 800 800
ෆැක්ස්ඃ 0115 678 000
විද්‍යුත් තැපැලඃ
chandanajayaratne@gmail.com

**ගරු උප සභාපතිවරු**

වෛද්‍ය ධම්මික ආරියනන්ද මහතා
විපුලතේජ විශ්වනාත් අපොන්සු
මහතා

**ගරු සම ලේකම්වරු**

අජිත් නිශාන්ත මහතා
දූ.කඃ 0714 467 272
රොෂාන් බොතේජු මහාතා
දූ.කඃ 072 1218 094

**ගරු භාණ්ඩාගාරික**

දිනේෂ් අමරසිරි මහතා

**ගරු උප භාණ්ඩාගාරික**

කපිල රොෂාන් ඉලේපෙරුම මහතා

**ගරු සංස්කාරක**

පත්මකුමාර ජයසිංහ මහතා

**ගරු කාරක සභිකවරු**

සුරේෂ් කෞශල්‍යය මහතා
ජී. ජී. තිලකසිරි මහතා
වික්‍රම ගුණදාස මහතා
එච්. ජී. කේ. එදිරිසිංහ මහතා
අසංක කෝසල එදිරිසිංහ මහතා

# අප ගැන වචනයක්....

මෙත් සවිය සංසදය නිරවුල් මනසක් ඇති වර්ධනය කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රී ලාංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් වසර දහයකට පෙර අරඹන ලද සාමාජිකයින්ගේ එකතුවකි. ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාළ විශේෂඥයින් හා උගතුන් ගෙන්වා සාමාජිකයින් දැනුවත් කරනු වස් විවිධ වැඩසටහන් මේ මගින් පැවැත්වීමට බලාපොරොත්තු වනු ලැබේ. වැඩසටහන් සඳහා මාතෘකා තෝරා ගැනීමද සාමාජිකයින්ගේ කැමැත්ත/ඉල්ලීම මත සිදුකරනු ලැබේ. සංසදය විසින් පවත්වනු ලබන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත් වන අන්දම, කාල කළමනාකරණය, නායකත්වය, ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන් වැනි ඒ ඒ කාලවලදී පවත්වන වැඩසටහන් සඳහා සහභාගිවීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයින්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයින්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීම සඳහා සෑම මාස තුනකටම වරක් දාන - සීල - භාවනා වැඩසටහන්ද පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන තිලතල දරන විධායක කමිටු හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයින් මාංශ භක්ෂණයෙන් හා රහමෙර පානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි.

වර්තමාන සාමාජික සංඛ්‍යාව 4500 ක් පමණ වන අතර මීළඟ චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන පැවැත්වීම හා නව සාමාජිකයින් බඳවා ගැනීම සඳහා සාමාජික අයදුම් පත් නිකුත් කිරීම 2013 ජුලි මාසයේදී සිදු කෙරේ.

වැල්ලවත්ත ශ්‍රී විජයාරාමය ප්‍රධාන මූලස්ථානය වශයෙන් පවත්වා ගනිමින් "මෙත් සවිය" මෛත්‍රී සංසදය පසුගිය දශකය පුරා සමථ විපස්සනා භාවනාවන් හාරදහස් පන්සියයකට අධික පිරිසකට උගන්වා ඇති ශාසන අභිවෘද්ධිය වෙනුවෙන් ඇපකැප වී කටයුතු කරන සංවිධානයකි. මීට අමතරව බෞද්ධ භාවනාවේ ප්‍රයෝජනය පිළිබඳව විද්‍යාත්මක පර්යේෂණ පවත්වමින් දෙස් විදෙස් ජාත්‍යන්තර සම්මන්ත්‍රන වලට එම පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරනු ලබන, අප දන්නා පරිදි ලංකාවේ ඇති එකම ආයතනයද "මෙත් සවිය" වේ (මින් සමහරක් අපගේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක). තවද මිරිස්වැටිය සළපතල මළුව ප්‍රතිසංස්කරණය ආරම්භ කිරීම, නාගදිප වන්දනාවේ යන බැතිමතුන්ගේ පහසුව සඳහා වසර 30 ක දිගු යුද්ධය නිම වී මාස 06 ක් යාමට පෙර නාගදීපය සහ කිළිනොච්චියේ ලුම්බිණි විහාරයේ වැසිකිළි පද්ධතීන් සාදා නිම කොට පූජා කිරීම. මහියංගන රජමහා විහාරයේ ලක්ෂයකට වැඩි පිරිසකට පිරිසිදු ජලය පානය කළ හැකි ජල පිරිපහදුවක් සාදා පූජා කිරීම. ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහළවීම සහ බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනය සිදුවී 2600 ක් ඉක්මවීම සැමරීම සඳහා අසුහාරදහසක් ධර්මස්කන්ධය සිහි වන අයුරින් ඓතිහාසික මහියංගනය රාජමහා විහාර පුදබිමෙහි අඩි 84 ක් උසැති "2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුදුපිළිමය"ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීම, එසේම රෝද පුටු පරිත්‍යාග කිරීම, කොළඹ ජාතික රෝහල, රිජ්වේ ආර්යා ළමා රෝහල හා මහරගම පිළිකා රෝහල ඇතුලු රෝහල් ගණනාවකට අවශ්‍ය උපකරණ ලබාදීම වැනි ලොකු කුඩා සද්කාර්යයන් රැසක් පසුගිය වසර දහය පුරා ඉටුකර ඇත.

සියලු ලෝ සතුන්ගේ සිත්තුල මෛත්‍රිය පැතිරේවා.....!

## සාමාජිකයින් සඳහා
වැදගත් තොරතුරු

# මීළඟ ත්‍රෛමාසික දාන සීල භාවනා වැඩසටහන

අප සංගමයේ මීළඟ මාසික දාන - සීල - භාවනා වැඩසටහන හා රැස්වීම 2013 ජූලි මස 07 වන ඉරුදින රාජගිරිය කළුපළුවාවේ තපෝවනයේ දී පැවැත්වේ. එදින වැඩසටහනට සහභාගි වන සියළු සාමාජිකයින් සිල් සමාදන් වීමට සුදු ඇඳුමින් පැමිණෙන්නේ නම් මැනවි. එදින පැමිණෙන විට හීල් දානය හා දහවල් දානය සඳහා ඔබට හා තවත් කෙනෙකුට සෑහෙන සේ පළතුරු රැගෙන එන්න.

මෙත් සවිය භාවනා පවුල්වල සාමාජිකයින් එක් වී (දුරකථන මගින් සාකච්ඡා කර) අවශ්‍ය දානය රැගෙන ඒමද සිදු කල හැක. භාවනා මධ්‍යස්ථානයේ වැඩ වසන භාවනානුයෝගි ස්වාමින්ද්‍රයන් වහන්සේලා 30 නමක් පමණ වැඩසිටින භාවනා මධ්‍යස්ථානයට පිරිකර පුජා කිරිමට කැමති භවතුන් භාවනා මධ්‍යාස්ථානයට දනට හිඟව පවතින පහත සඳහන් ද්‍රව්‍යවලින් (ගරු නායක ස්වාමීන්ද්‍රයන්ගෙන් හා ලියන මහතාගෙන් අප කළ විමසීමෙන් දැනගත් පරිදි) යමක් පුජාකරන්නේ නම් එය විචාර බුද්ධියෙන් කරනු ලබන මහත් පුණ්‍යකර්මයක් වනු ඇත. භාවනා කරන ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් මදුරු දැගර, රෙදි, පාපිසි, දාන ශාලාවට අවශ්‍ය පිඟන් කෝප්ප, හැඳි, ඉගෙන ගන්නා ස්වාමීන් වහන්සේලාට අවශ්‍ය A4 කඩදාසි කොළ, පොත්පත්, බෝල්පොයින්ට් පෑන් ආදීය හා දානය ගෙන යාමට සඳහා භාවිතා කළ හැකි ප්ලාස්ටික් බාල්දි, වැසිකිළි සඳහා බාල්දි, පෙඩස්ටල් විදුලි පංකා, මුද්දර කවර, ටෝච්, ඉටිපන්දම්, පෙන්ටෝච් බැටරි, දනට අවශ්‍ය ද්‍රව්‍යයි. මේ පිළිබඳව වැඩි විස්තර අවශ්‍ය නම් මෙත් සවිය කාර්යාලය 071- 4014467 මගින් අමතා දැන ගත හැක. එදින පෙ.ව.8.00 වන විට කලපළුවාව ගෞතම තපෝ වනයේදී අටසීල් සමාදන් වීමට බලාපොරොත්තු වන බැවින් පුද්ගලිකව පැමිණෙන පිංවතුන් පෙ.ව.8.00 වන විට තපෝවනයට පැමිණ සිටිය යුතුය (බොරැල්ල බස්නැවතුම් පලෙන් මාර්ග 150 බස් රථයෙන් පැමිණෙන විට තපෝවනය අසලින් බැසිම සිදු කළහැකිය).

ලිපිනයඃ ගෝතම තපෝවනය ,
කලපළුවාව, මුල්ලේරියාව,
නව නගරය.

මීට අමතරව, මෙත් සවිය මඟින් කොළඹ 07, බෞද්ධාලෝක මාවතයේ පිහිටි ධම්මගවේෂී බෞද්ධ ආශ්‍රමය අසල සිට තපෝවනය දක්වා පෙ.ව.6.00 සිට පෙ.ව.7.30 දක්වා ෂටල් බස් සේවාවක් යොදවා ඇත. වැඩි විස්තර සමලේකම් රොෂාන් මහතා අමතා (071- 21218094) දැන ගත හැක. කලින් මුදල් ගෙවීම අවශ්‍ය නැත (එදින රුඃ 100/- ක් වැනි සුළු මුදලක් ගෙවා යා හැකිය). ප.ව.4.00ට වැඩසටහන අවසන් වුවාට පසු අවශ්‍ය අයට බොරැල්ලට පැමිණිමට ද බස්රථ සේවාව යොදවා ඇත.

**මීළඟ (27 වන) චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන**

2013 අගෝස්තු 18 වන ඉරුදින ආරම්භ වීමට නියමිත අතර, ඒ සඳහා ඉල්ලුම්පත් 2013 ජුලි 31 දින දක්වා බාර ගැනේ. මේ සඳහා සහභාගී වීමට බලාපොරොත්තු වන සාමාජිකත්වය අලුත් කරගත් පැරණි සාමාජිකයින් 2013 -07-31 දිනයට ප්‍රථම ඒ බව කාර්යාලයට දන්වන්න.

---

**ප්‍රායෝගික අධිමානසික විද්‍යාව හා පංච අභිඥා පිළිබඳව දැනුවත් කිරිමේ 24 වන වැඩසටහන**

2013 . 08 .18 දින පෙ.ව. 10.00 ට අරඹනු ලබන අතර ඒ සඳහා අයදුම්පත් 2013.07.30 දිනට පෙර භාර ගනු ලැබේ. ඉඩකඩ සීමිත බැවින් පළමුව ලියාපදිංචි වන අය සඳහා මුලිකත්වය ලබා දේ.


---

**මෙත්සවිය සඟරාවේ පල කිරිම සඳහා සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ පල කරනු ලබන දැන්විම් භාර ගැනීම.**

මීළඟ මෙත් සවිය සඟරාවේ පල කිරිම සඳහා ලබාදෙන සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ පල කරනු ලබන දැන්විම් 2013.09.30 දිනයට පෙර සභාපතිතුමා වෙත හෝ සංස්කාරකතුමාට/කාර්යාලයට හෝ භාර දෙන්න.

# 2013 මෛත්‍රී භූෂණ

## සම්මානලාභී සුපින්වතුන්



*සිද්ධි රස්තු*

මෙත් සිත් පෙරදැරි ජාතික මෙහෙවර විශිෂ්ට සේවය හා ප්‍රවීණතාවය උදෙසා පිරිනැමෙන උපහාර සම්මානයයි.

සිරිලක බුදු සසුන වඩ-වඩාලනුව මුළු සිතින් කැපවෙමින්, වයස 15 දී බ්‍රහ්මචාරී ජීවිතයට ඇතුළත්ව හා පසු කාලීනව නිකායත්‍රයේ ම 21 වතාවක් පැවිදි ජීවිතයට ඇතුළත්ව ගමින් ගමට, නගරයෙන් නගරයට, රටින් රටට යමින් ලක්‍ෂ සංඛ්‍යාත ලෝ වැසි ජනතාවට භාවනාව ඉගැන්වීමට ඇප කැප වන අතර තුර කුඩා කල සිට මේ දක්වා පුරා මස් මාංශ ආහාරයෙන් වැලකී අවිහිංසාව ප්‍රගුණ කරමින් ලෝ වැසි ජනතාව අවිහිංසාවාදී දිවි පැවැත්මකට යොමු කිරීමට වෙර දරමින් සමස්ත ලංකා අවිහිංසාවාදී ඒකාබද්ධ මහා සම්මේලනයේ අනුශාසක ධුරය දරමින් මරණයේ දොරටුව අභියස සිටිනා ගවයින් ඇතුළු සිය ගණනක් සතුන් මරණයෙන් නිදහස් කොට අභයදානය දෙමින් ද ශ්‍රී ලංකා අමද්‍යප සභාවේ ගරු ප්‍රධාන සභාපතිත්වය දරමින් ද ජනතාව පන්සිල් සුරකින් සදාචාර සම්පන්න පිරිසක් ලෙස පෙළගැස්වීමට ඇපකැපවී කටයුතු කරනා

කොළඹ 07 ජාත්‍යන්තර විපස්සනා භාවනා මධ්‍යස්ථානාධිපති ලෙස වසර දහයකට අධික කාලයක් වැඩ සිටින

**අතිපූජ්‍ය ආචාර්ය භාරිස්පත්තුවේ අරියවංශාලංකාර ස්වාමීන්ද්‍රයන් වහන්සේට**

"මෛත්‍රී භූෂණ ශාසන මාමක" ගෞරව සම්මානය

සිරි බුදු වසින් 2556 වෙසක් පුර නවවක ලත් රිවි දින හෙවත් ව්‍යවහර වසරින් 2013 මැයි 19 වන දා කොළඹ 05, ශ්‍රී සම්බුද්ධ ජයන්ති මන්දිරයේ දී පවත්වන්නට යෙදුන මෙත් සවිය දස වන සංවත්සර සැමරුම් උළෙලෙහි දී ප්‍රදානය කළ වගයි.



*සිද්ධි රස්තු !*

මෙත්සිත් පෙරදැරිව ජාතික මෙහෙවර විශිෂ්ට සේවාව හා ප්‍රවීණතාවය උදෙසා පිරිනැමෙන උපහාර සම්මානයයි

පරපණ නසා සකසන මාංශ භක්‍ෂණයෙන් පිළිකා ඇතුළු බොහෝ ලෙඩ රෝග මිනිසාට ඇතිවන බව වෛද්‍ය විද්‍යාත්මකව පෙන්වා නිරෝගී දිවියක් සඳහා නිර්මාංශ ආහාරවල ගුණාත්මක භාවය මඳ යැයි පැතිර තිබූ දුර්මත විදුනැණ යොදා දුරු කරමින් නිරෝගී දිවිපැවැත්මක් සඳහා සුදුසුම ආහාරය අවිහිංසාවාදීව සපයා ගත් නිර්මාංශ ආහාර බවට විශේෂඥ වෛද්‍යවරයෙකු ලෙස අභීතව ඉදිරිපත්ව ලෝ වැසි ජනතාවට සත්‍ය කියා දුන් සහ එමගින් මිනිස් කුස තුළට යාමට සිටි ලක්‍ෂ සංඛ්‍යාත සතුන්ගේ දිවි ගලවා අභය දානය ලබාදෙමින් මෙත් සිතැතිව අසමසම සේවයක් ඉටු කරන වත්මනෙහි ලක්දිව වෙසෙන ජ්‍යෙෂ්ඨතම හෘදයරෝග විශේෂඥ

**වෛද්‍ය ඩී. පී. අතුකෝරළ මැතිඳුනට මෙත් සවිය ගරු උපහාර සම්මානය වන**

"මෛත්‍රීභූෂණ ආරෝග්‍යා වාචස්පති" ගෞරව නාම සම්මානය

සිරි බුදු වසින් 2556 වෙසක් පුර නවවක ලත් රිවි දින හෙවත් ව්‍යවහර වසරින් 2013 මැයි 19 වන දා කොළඹ 05, ශ්‍රී සම්බුද්ධ ජයන්ති මන්දිරයේ දී පවත්වන්නට යෙදුන මෙත් සවිය දස වන සංවත්සර සැමරුම් උළෙලෙහි දී ප්‍රදානය කළ වගයි.

මෛත්‍රී භූෂණ....



## සිද්ධි රස්තු !

මෙත්සිත් පෙරදැරි ජාතික මෙහෙවර විශිෂ්ට සේවය හා ප්‍රවීණතාවය උදෙසා පිරිනැමෙන උපහාර සම්මානයයි.

මෛත්‍රිය, කරුණාව දසත පතුරවමින් 'සබ්බේසං ජීවිතං පියං' යන බුදු වදන මුදුනින් ගෙන කුරිරු බිහිසුණු වධහිංසාවලට ගොදුරු වෙමින් මරණයේ දොරටුව අභියස සිටිනා ගවයින් සුවහසක් ගණනකට නැවත දිවි වරම උදාකර දීමෙහිලාත් ජනමාධ්‍ය මගින් ලක්වැසි ජනතාව ඊට පොළඹවීමෙහිලාත් අසමසම මෙහෙවරක් ඉටුකරන මැලිබන් ව්‍යාපාරයේ ප්‍රධාන විධායක නිලධාරී

**ලක්ෂ්මන් වීරසූරිය මැතිඳුන්ට**

මෙත් සවිය ගරු උපහාර සම්මානය වන "මෛත්‍රී භූෂණ අහිංසා සාදක" ගෞරව නාම සම්මානය

සිරි බුදු වසින් 2556 වෙසක් පුර නවවක ලත් රිවි දින හෙවත් ව්‍යවහර වසරින් 2013 මැයි 19 වන දා කොළඹ 05, ශ්‍රී සම්බුද්ධ ජයන්ති මන්දිරයේ දී පවත්වන්නට යෙදුන මෙත් සවිය දස වන සංවත්සර සැමරුම් උළෙලෙහි දී ප්‍රදානය කළ වගයි.

### බෝධිසත්වයෝ ගෞතම

යමෙකුගේ දුකට හේතුව ජීවිතයේ අධිෂ්ඨානාය පෙනෙන්නට නොදී මුවහත් කරන ඔවුන් තුලම වූ අවිද්‍යාවයි. යථාතත්වය නොදන්නා කමයි. නෑයන් සමඟ එක්ව විනෝද සැපයෙන් කල් ගෙවීම සිහින දැකීමක් බඳුය. ප්‍රියයන්ගෙන් වෙන් වෙමිය සිතනා විට ශෝකය ඇති වේ. ලොව ඉන්නාතාක්ම ප්‍රිය විප්පයෝග දුක ඇති වේ. එයින් වළකින්නට නම් ඒ දුක ඇති ලොවින් ඉවත් විය යුතුවේ. එයට මග සොයා යෑම පිණිස මා ඉදිරියට තැබූ පියවර ආපසු නොගනිමි. මාගේ අභිමතාර්ථය ඉටුකරගෙනම මිස එසේ නැතිව නෑදෑයන් වෙත නොඑන්නෙමි.

උපුටා ගැනීම
**බුද්ධ චරිතය**
**බලංගොඩ ආනන්ද මෛත්‍රී නාහිමි**

**මෙත් සවිය දසවන සංවත්සරය වෙනුවෙන් 26/05/2013 දින ශ්‍රී විජයාරාම විහාරස්ථානයේ දී ලේ දන්දීම, අක්ෂි සායනය සහ වෛද්‍ය සායනය පැවැත්වීමේ මහා පුණ්‍යකර්මයට සහය දුන් සැමට මෙත් සිත් පෙරදැරිව කෙරෙන පුණ්‍යානුමෝදනාවයි.**

01 ජාතික රෝහලේ වෛද්‍ය සහ හෙද කාර්ය මණ්ඩලයට

02 මධ්‍යම ලේ බැංකුවේ වෛද්‍ය සහ හෙද කාර්ය මණ්ඩලයට

03 ඇස් පරීක්ෂාව සඳහා සපැමිණි කොළඹ නයනාරෝග්‍ය ශාලාවේ අක්ෂි රෝග විශේෂඥ වෛද්‍ය චම්පා බානගල මහත්මිය සහ කාර්ය මණ්ඩලයට

04 ඇස් කණ්නාඩි ලබාදීම සඳහා ඇස් පරීක්ෂාකර අවශ්‍ය සියලුදෙනා හට නොමිලයේ කණ්නාඩි කාච ලබා දුන් නුගේගොඩ අනුලා විදුහල ඉදිරිපිට "සයිට් එන් ස්ටයිල් ඔප්ටෝමෙට්‍රිස්ට්" හි අධිපති නෙරංජලා කන්නංගර මහත්මියට හා දෘෂ්ඨී විශේෂඥ පිරිසට

05 නොමිලයේ ඇස් කණ්නාඩි ලබාදීම සහ අවශ්‍ය කණ්නාඩි 196 ක් ලබා දුන් එංගලන්තයේ බ්‍රිස්ටල් හි පදිංචි ලක්ෂ්මන් පත්මකුමාර මහතාට හා එය සම්බන්ධීකරණය කර දුන් විදේශ කටයුතු අමාත්‍යංශයේ එම්. ආර්. ලෙනගල මහතාට මෙත් සවිය සංසදයේ විශේෂ ස්තුතිය.

ඉහත කටයුතු සම්බන්ධීකරණය කර දුන් මෙත් සවිය අසරණ සරණ කමිටුවට හා එහි සභාපතිව සිටි වෛද්‍ය ධම්මික මහතාට හා ඇස්කණ්නාඩි රාමු සැපයීම සම්බන්ධීකරණය කර දුන් බුදු පිළිම කමිටු සභාපතිව සිටි විශ්වනාත් අපෝන්සු මහතාටද අපගේ කෘතවේදය හිමිවේ.

*- පිංතූර සඳහා අවසාන පිටුව බලන්න. -*

# මෙත් සවිය

## දසවර්ෂ පූර්ණ සංවත්සර උළෙලට අධාර කල සුපින්වතුන්

| | | |
|---|---|---|
| 1 | ඩී. ඒ. පෙරේරා (ලංකාදීප ප්‍රවෘත්ති අතිරේකය සඳහා) | 65000.00 |
| 2 | ඩී. ජී. කේ. ආරියරත්න | 50000.00 |
| 3 | තුෂාරිකා ප්‍රනාන්දු සහ නදීෂ් ප්‍රනාන්දු | 40000.00 |
| 4 | වෛද්‍ය ජයනාත් අබේවික්‍රම | 30000.00 |
| 5 | සමන්ති අනුබුදු | 30000.00 |
| 6 | සුවසෙත කමිටුව (සීතා ගෝමස් මිය විසින්) | 25000.00 |
| 7 | බී. ඩබ්. කුමුදිනී අබේකෝන් | 20000.00 |
| 8 | චම්පිකා අල්විස් | 15000.00 |
| 9 | සීතා ගෝමස් | 10000.00 |
| 10 | සමරසිංහ ඔටෝ පාට්ස් හවුස් (පූජ්‍ය අහංගම ආනන්ද හිමි විසින්) | 10000.00 |
| 11 | මහින්ද බොතේජු සහ සුජාතා බොතේජු | 10000.00 |
| 12 | එස්. ඒ. ඇසෝසියේට් | 10000.00 |
| 13 | එච්. ආර්. සොයිසා | 10000.00 |
| 14 | කසුන් රාජපක්ෂ | 10000.00 |
| 15 | ජේ. එම්. ඩී. පියුෂාන් | 10000.00 |
| 16 | ඉන්ද්‍රාණි මානෙල් විජේරත්න | 10000.00 |
| 17 | වී. එස්. චන්ද්‍රසෝම | 10000.00 |
| 18 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව (විරාජ් පීරිස් විසින්) | 10000.00 |
| 19 | මහේන්ද්‍ර ද සිල්වා | 10000.00 |
| 20 | ලාෆ්ස් ගෑස් (ශ්‍යාමා සමරධීර විසින්) | 10000.00 |
| 21 | Emerchemic NB ( Ceylon ) Limited (රාමසිංහ මෙනෙවිය විසින්) | 10000.00 |
| 22 | Senkadagala Finance PLC (ශ්‍යාමා සමරධීර විසින්) | 10000.00 |
| 23 | ජී. එම්. ඩික්මන් අපෝන්සු ජෝතිෂ්‍ය පදනම (විශ්වනාත් අපෝන්සු මහතා විසින්) | 10000.00 |
| 24 | ඩබ්. තිලකරත්න | 10000.00 |
| 25 | මලින් යාපා අමරසේකර (ශ්‍යාමා සමරධීර විසින්) | 10000.00 |
| 26 | Ceylon Petrolium (ඉදිරිසිංහ මහතා විසින්) | 10000.00 |
| 27 | ඩබ්. එස්. මනිමෙල් වැලිවිට | 10000.00 |
| 28 | චම්පිකා සිරිබද්දන | 10000.00 |
| 29 | ස්වර්ණ ගුණසේකර | 8000.00 |
| 30 | රොෂාන් ඉලේපෙරුම | 7000.00 |
| 31 | A to Z Engineering | 7000.00 |
| 32 | කේ. ඒ. කරුණාතිලක | 7000.00 |
| 33 | වෛද්‍ය රුක්ෂානා ද සිල්වා | 6000.00 |
| 34 | Peoples Leasing and Finance Company Ltd | 5000.00 |
| 35 | සුජාතා දිසානායක | 5000.00 |
| 36 | ක්ලෙමන්බග් (පෞද්) සමාගම (ශ්‍යාමා සමරධීර විසින්) | 5000.00 |
| 37 | ඊ. ධම්මික අබේසේකර | 5000.00 |
| 38 | ජී. ජී. තිලකසිරි | 5000.00 |
| 39 | ප්‍රේමා සේරසිංහ | 5000.00 |
| 40 | සමුදු ලංකා එන්ටර්ප්‍රයිසස් | 5000.00 |
| 41 | සබීල් එන්ටර්ප්‍රයිසස් (එච්. ආර්. සොයිසා මහතා විසින්) | 5000.00 |
| 42 | එල්. කුමාරි ගුණතිලක | 5000.00 |
| 43 | තිලකරත්න යුවල | 5000.00 |
| 44 | පුෂ්පා බත්කන්දගේ (සීතා ගෝමස් මෙය විසින්) | 5000.00 |
| 45 | නුවන් චාමර ෆොන්සේකා (සීතා ගෝමස් මෙය විසින්) | 5000.00 |
| 46 | නවීන් සේනාධීර (සීතා ගෝමස් මෙය විසින්) | 5000.00 |
| 47 | වෛද්‍ය එල්. කේ. කළුබෝවිල | 5000.00 |
| 48 | එල්. සුජාතා වනිගසේකර | 5000.00 |
| 49 | ඩී. ඒ. අයි. ඩයස් | 5000.00 |
| 50 | සුගත හේවාගමගේ | 5000.00 |
| 51 | එල්. ඩී. එම්. අල්විස් | 5000.00 |
| 52 | ප්‍රියදර්ශනී පෙරේරා | 5000.00 |
| 53 | ඕ. පී. එම්. දීපිකා | 5000.00 |
| 54 | ලොරෙටා නුස්ලි | 5000.00 |
| 55 | ගාමිණී තුමන්සිංහ | 5000.00 |
| 56 | පද්මකාන්ති පෙරේරා | 5000.00 |
| 57 | එන්. ඩී. ජී. හෙට්ටිආරච්චි | 5000.00 |
| 58 | සුදාර ජයසිංහ | 5000.00 |
| 59 | නෙරංජන් වික්‍රමසිංහ | 5000.00 |
| 60 | මෙඩි සොලියුෂන්ස් (පෞද්) සමාගම | 5000.00 |
| 61 | ඉලෙක්ට්‍රොමෙටල් ප්‍රෙමින් (පෞද්.) සමාගම | 5000.00 |
| 62 | කාසල් බිල්ඩර්ස් (බී. ඩබ්. කුමුදිනී අබේකෝන් මෙනවිය විසින්) | 5000.00 |
| 63 | ලිලන්ත පෙරේරා | 5000.00 |
| 64 | උරේෂා රූපසිංහ | 5000.00 |
| 65 | නයනා සිරිවර්ධන | 5000.00 |
| 66 | මාධවී කොණ්ඩදෙණිය | 5000.00 |
| 67 | සී. ඒ. චන්ද්‍රකාන්ති | 5000.00 |
| 68 | කුමාර විමලසේන | 5000.00 |
| 69 | Cheman ex PLC (ශ්‍යාමා සමරධීර විසින්) | 5000.00 |
| 70 | Speed mark Security Servises (pvt ) Ltd | 5000.00 |
| 71 | ඩී. ආර්. නන්දදේව | 5000.00 |
| 72 | මිතිලා කුමුදු උදයංගනී මැදවත්තගේ | 5000.00 |
| 73 | ශ්‍යාමා සමරධීර | 5000.00 |
| 74 | රංග දයාසේන | 5000.00 |
| 75 | සංජය ජයලත් (වෛද්‍ය රුක්ෂානා ද සිල්වා විසින්) | 5000.00 |

**උප සභාපතිව සිටි සරත් ඉලංගන්තිලක මහතා ඩොලර් 500ක මුදලක් ලාමාතුමන් වෙත ප්‍රධානය කල අතර පැමිණී සිටි සියලුම දෙනාට සිදුකල සංග්‍රහ කටයුතු වල සම්පූර්ණ අනුග්‍රහකත්වය දැරීය.**

| | | |
|---|---|---|
| 76 | කේ. ආර්. ජී. විජේසුන්දර ජාතික සහ සේවක සුහසාධක සංගමය (ප්‍රියදර්ශනී ද මෙල් මෙනෙවිය විසින්) | 5000.00 |
| 77 | අශෝකා හේමමාලා ජයතිලක | 5000.00 |
| 78 | ලිලියන් කුමාරසිංහ | 5000.00 |
| 79 | එච්. හේමන්ත ප්‍රනාන්දු | 5000.00 |
| 80 | ප්‍රසන්න කුලරත්න | 5000.00 |
| 81 | එම්. වික්‍රමසිංහ (වෛද්‍ය රුක්ෂානා ද සිල්වා) | 5000.00 |
| 82 | චන්ද්‍රිකා විජේරත්න (වෛද්‍ය රුක්ෂානා ද සිල්වා) | 5000.00 |
| 83 | එස්. කේ. කළුබෝවිල | 5000.00 |
| 84 | ඉන්දු ලංකා දඹදිව චාරිකා සංවිධායකයෝ | 5000.00 |
| 85 | කුමාරි ජයසුන්දර | 5000.00 |
| 86 | ධම්මිකා තරංගනී ලියනගේ | 5000.00 |
| 87 | හිමාලි සමරකෝන් පෙරේරා | 5000.00 |
| 88 | මෙඩි ඉක්විප්මන්ට්ස් සමාගම (රාමසිංහ මෙනෙවිය විසින්) | 5000.00 |
| 89 | මැන් කයින්ඩ් ෆාමා සමාගම (රාමසිංහ මෙනෙවිය විසින්) | 5000.00 |
| 90 | Swiss Biogenics Limited (රාමසිංහ මෙනෙවිය විසින්) | 5000.00 |
| 91 | Secure Security & Investigations (pvt) Ltd | 5000.00 |
| 92 | උදාරි එදිරිසූරිය | 4000.00 |
| 93 | කුසුමා රංජනී හේවාපතිරණ | 3000.00 |
| 94 | පුෂ්පා රොද්‍රිගෝ | 3000.00 |
| 95 | කේ. දයා කාරියවසම් | 3000.00 |
| 96 | කේ. එස්. අයි. කටුගම්පල | 3000.00 |
| 97 | ඒ. ලලිත් කුමාරසිරි | 3000.00 |
| 98 | ආර්. එන්. ඩබ්. ගුණවර්ධන | 3000.00 |
| 99 | රමණි කුරුප්පු | 3000.00 |
| 100 | ඊෂා ජයනෙත්ති | 3000.00 |
| 101 | එම්. චන්ද්‍රකීර්ති ෆොන්සේකා | 3000.00 |
| 102 | චන්ද්‍රසිරි සුබසිංහ | 2500.00 |
| 103 | ඒ. සමන්ත ප්‍රියලාල් | 2000.00 |
| 104 | ඉන්ද්‍රානි මාලනී පෙරේරා | 2000.00 |
| 105 | ආර්. ඉන්ද්‍රජිත් ගුණසේකර | 2000.00 |
| 106 | කේ. ජී. එම්. ලියනගේ | 2000.00 |
| 107 | ඩබ්. එම්. පී. පෙරේරා | 2000.00 |
| 108 | සරත් සුගතදාස රාජනෙත්ති | 2000.00 |
| 109 | යසරත්න එන්ටර්ප්‍රයිසස් (එදිරිසිංහ මහතා විසින්) | 2000.00 |
| 110 | රෝහිණී ශාතා පෙරේරා | 2000.00 |
| 111 | ටී. ජී. එන්. ශාන්ත | 2000.00 |
| 112 | ආර්. ඩබ්. ගුණරත්න | 1500.00 |
| 113 | ආර්. චන්ද්‍රලතා | 1500.00 |
| 114 | සී. දේවි වීරසේකර | 1500.00 |
| 115 | කේ. ටී. ඒ. ඒ. ඩී. පොඩිබණ්ඩාර | 1500.00 |
| 116 | ප්‍රදීප් කුමාර වීරකෝන් | 1500.00 |
| 117 | එස්. ඩී. වල්ලල්විට | 1000.00 |
| 118 | එච්. ඩී. දිලාන් මධුරංග | 1000.00 |
| 119 | සී. ඒ. ඒ. එල්. කුමාරි | 1000.00 |
| 120 | ජීවන්ති විමලවීර | 1000.00 |
| 121 | ධම්මදින්න මන්ත්‍රිරත්න | 1000.00 |
| 122 | ප්‍රියානි මායාදුන්නේ | 1000.00 |
| 123 | කේ. ජී. බුද්ධික ගයාන් පීරිස් | 1000.00 |
| 124 | Sivanandam and Association | 1000.00 |
| 125 | ආර්. එම්. එස්. යූ. කුරේ | 1000.00 |
| 126 | ජී. ඩබ්. පුෂ්පා නන්දනි | 1000.00 |
| 127 | එම්. වීරසිංහ | 1000.00 |
| 128 | පී. සූරියාරච්චි | 1000.00 |
| 129 | වී. එස්. ටී. ස්වර්ණපාලි | 1000.00 |
| 130 | කේ. වී. විජේතිලක | 1000.00 |
| 131 | එම්. ඒ. වී. පී. ගුණවර්ධන | 1000.00 |
| 132 | චන්ද්‍රකාන්ති විජේසිංහ | 1000.00 |
| 133 | ආර්. එම්. දයාවතී මැණිකේ | 1000.00 |
| 134 | පී. එම්. ප්‍රියන්ති ප්‍රනාන්දු | 1000.00 |
| 135 | ටී. විදානපතිරණ | 1000.00 |
| 136 | බී. ශ්‍රියාලතා කුරේ | 1000.00 |
| 137 | වී. කේ. දලුගම | 1000.00 |
| 138 | පද්මා බස්නායක | 1000.00 |
| 139 | වී. එම්. ශාන්ත ගීගනගේ | 1000.00 |
| 140 | අජිත් ප්‍රනාන්දු | 1000.00 |
| 141 | එල්. ජී. කරුණාරත්න | 1000.00 |
| 142 | එන්. එම්. එම්. නවරත්න | 1000.00 |
| 143 | එන්. අයි. එස්. ජයවීර | 1000.00 |
| 144 | එච්. ඒ. ඩී. සුජීව | 1000.00 |
| 145 | ජී. විජේතුංග | 1000.00 |
| 146 | මිලින්ද සූරියාරච්චි | 1000.00 |
| 147 | ඩී. ශ්‍රියාණි රාජපක්ෂ | 1000.00 |
| 148 | පුෂ්පා ඔබේසේකර | 1000.00 |
| 149 | එම්. ඩී. එස්. පී. ගුණතිලක | 1000.00 |
| 150 | ආර්. එම්. ඩී. ඩී. අමරසූරිය | 1000.00 |
| 151 | තරංග ජයසිංහ | 1000.00 |
| 152 | පුෂ්පලතා සෙනරත් | 1000.00 |
| 153 | ජී. වී. ඉයුලින් පෙරේරා | 1000.00 |
| 154 | අයි. මෙත්තසිංහ | 1000.00 |
| 155 | ඩබ්. එස්. සී. ද සිල්වා | 1000.00 |
| 156 | ඒ. බී. ආරියවතී | 1000.00 |
| 157 | සී. එම්. විදානපතිරණ | 1000.00 |
| 158 | ඉන්ද්‍රාණි විදානපතිරණ | 1000.00 |
| 159 | ලේලානන්ද කොඩිතුවක්කු | 1000.00 |
| 160 | ආර්. ලීලාවතී පෙරේරා | 1000.00 |
| 161 | ඩබ්. ජේ. පෙරේරා | 1000.00 |
| 162 | ටී. ආර්. ඉඹුල්දෙණිය | 1000.00 |
| 163 | රංජිනී ඩී. වික්‍රමසිංහ | 1000.00 |
| 164 | නන්දසේන මෙවලතන්ත්‍රි | 1000.00 |
| 165 | ජේ. එම්. පී. බණ්ඩාර | 1000.00 |
| 166 | ඒ. කේ. ලියනගමගේ | 1000.00 |
| 167 | එල්. උපුල් | 1000.00 |
| 168 | එච්. එස්. හේමපාල | 1000.00 |
| 169 | එඩ්වඩ් සමරවික්‍රම | 1000.00 |
| 170 | පී. ජී. කේ. මඩවල | 1000.00 |
| 171 | ජේ. ඒ. දයාවතී | 1000.00 |
| 172 | සී. එම්. පාලිත දිසානායක | 1000.00 |
| 173 | පී. එම්. සේනාධීර | 1000.00 |
| 174 | කේ. සුගතපාල | 1000.00 |
| 175 | අමල් අමුපේගම | 500.00 |
| 176 | සීතා අධිකාරි | 500.00 |




# මෙත් සවිය
## දස වර්ෂ පූර්ණ
## සංවත්සර උළෙල.......

මෙයින් දස වසරකට පෙර එවැනිම වූ වෙසක් මසක නිරවුල් මනසක් සහ ප්‍රගුණ කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් බෞද්ධයින් පිරිසක් බිහි කරනු වස් මහාචාර්ය චන්දන ජයරත්න මැතිදුන්ගේ මුලිකත්වයෙන් 'මෙත් සවිය 'මෛත්‍රී සංසදය ඇරඹෙන්නට යෙදුණි.


වෙසඟයේ සකල ලෝකවාසී බෞද්ධ ජනතාව ආමිස සහ ප්‍රතිපත්ති පූජාවන් වල නිරත වෙමින් සිහිකරන්නේ තිලෝගුරු අමා මෑණී සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ තෙමගුලයි. එනිසාම බෞද්ධයින්ට මෙම කාලසීමාව මංගලකාරණාවන් සඳහාම වෙන් වන අතර සියලු ක්‍රියාකාරකම් බුද්ධාගමෙහි චිරස්ථිතිය සහ අභිවෘධිය සඳහා වන කරුණු කාරණාමයි. එලෙසම මෙයින් දසවසරකට පෙර එවැනිම වූ වෙසක් මසක නිරවුල් මනසක් සහ ප්‍රගුණ කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් බෞද්ධයින් පිරිසක් බිහි කරනු වස් මහාචාර්ය චන්දන ජයරත්න මැතිඳුන්ගේ මුලිකත්වයෙන් 'මෙත් සවිය' මෛත්‍රී සංසදය ඇරඹෙන්නට යෙදුණි. එතැන් පටන් සාමාජිකයන් හාරදහස් පන්සියයකට අධික ප්‍රමාණයක් බිහිකරමින්ද විවිධ පින්කම් සහ අධ්‍යාත්මික වැඩසටහන් රැසක් මඟින් බුදු දහමෙහි චිරස්ථිතිය උදෙසා බුද්ධිමත් ජනතාවක් බිහි කරමින් ද 'මෙත් සවිය' ධාර්මික ගමනක යෙදෙන්නේ අතිපූජ්‍ය අහංගම ආනන්ද නාහිමිපාණන් ඇතුළු බුද්ධ පුත්‍රයන් රැසකගේ අනුසාසනා මධ්‍යයේයි. එහෙයින්ම මෙම වෙසක් මාසය මෙත් සවිය මෛත්‍රී සංසදයට අතිශයින් වැදගත් වන්නේ එහි දස වර්ෂ පූර්ණ සංවත්සරය සිරිබුදු වසින් 2556 වෙසක් මස පුර නවක ලත් රිවි දින හෙවත් ව්‍යවහාර වර්ෂයෙන් 2013.05.19 දිනට යෙදුනු හෙයිනි.

දස වර්ෂ පූර්ණක මහා සංවත්සර උළෙල සහ මෛත්‍රී භූෂණ උපහාර උළෙල කොළඹ 05, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවතේ, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේදී පැවැත්වුනි. උළෙල ප.ව.1.30 ට පමණ ගරු අග්‍රාමාත්‍ය දී.මු. ජයරත්න මැතිදුන්ගේ ප්‍රදානත්වයෙන් ආරම්භ වුනි. සාම්ප්‍රදායනුකූලව පොල් තෙල් පහන දැල්වීමෙන් අනතුරුව සමස්ථ ලංකා අමරපුර මහා සංඝ නායක අනුනායක අතිපූජ්‍ය කොටුගොඩ ධම්මාවාස නාහිමිපාණන් වහන්සේ ගේ මුලිකත්වයෙන් උත්සව සභාවේ





වැඩ කටයුතු කෙරෙන්නට යෙදුණි. මල් පහන් පූදා ආජීව අෂ්ඨමක ශිලය සමාදන් වීමෙන් පසුව මෙත් සවිය තේමා පාඨය කියවීම සිදුවිය. මෙත් සවිය මෛත්‍රී සංසදයේ ගරු සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මැතිදුන් පැමිණි සිටින ආරාධිත අමුත්තන් ඇතුළු සභා ගැබේ සියලුම දෙනා කරුණාවෙන් පිළි ගත්තේය. මෙත් සවිය මෛත්‍රී සංසදයේ ගරු අනුසාසක අතිපූජ්‍ය අහංගම ආනන්ද නාහිමිපාණන්ගේ අනුසාසනාවෙන් පසු ප්‍රධාන ආරාධිත අමුත්තා වන ගරු අග්‍රාමාත්‍ය දී.මු. ජයරත්න මැතිඳුන් උත්සව සභාව ඇමුතුවේය. ඉන් අනතුරුව මෛත්‍රී භූෂණ උපහාර උළෙල ආරම්භ වුන අතර සම්මාන ප්‍රධානය ගරු අගමැතිතුමන් අතින් සිදුවිය. මෛත්‍රී භූෂණ සම්මානලාභීන් වුයේ ගරුතර අතිපූජ්‍ය හාරිස්පත්තුවේ අරියවංශාලංකාර ස්වාමීන්ද්‍රයන් වහන්සේත්, හෘද රෝග විශේෂඥ වෛද්‍ය ඩී. පි. අතුකෝරළ මහතා සහ මැලිබන් සමුහ ව්‍යාපාරයේ අධ්‍යක්ෂක දූරන්දර ලක්ෂමන් වීරසූරිය මහතා ඇතුළු බෞද්ධ සංස්කෘතිය සහ එහි චිරස්තිථිය උදෙසාම මෛත්‍රී සහගත ක්‍රියාදාමයක එළඹ සිටින සැබෑ බෞද්ධයින් තිදෙනෙකුටය. එපමණක් නොව දස වසරක් අභිමානය පිළිබිඹු කරමින් ආරම්භක සමාජිකයින්

මල් පහන් පූදා ආජීව අෂ්ඨමක ශිලය සමාදන් වීමෙන් පසුව මෙත් සවිය තේමා පාඨය කියවීම සිදුවිය. මෙත් සවිය මෛත්‍රී සංසදයේ ගරු සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මැතිදුන් පැමිණි සිටින ආරාධිත අමුත්තන් ඇතුළු සභා ගැබේ සියලුම දෙනා කරුණාවෙන් පිළිගත්තේය.









දස දෙනකුට ද සම්මාන ප්‍රදානය සිදුවිය. එපමණක් නොව බුද්ධ සාසන අමාත්‍ය ලෙස ගරු දී.මු. ජයරත්න මැතිදුන් ද සම්මානයට පාත්‍ර විය.

අරිසෙන් අහුබුදු සූරීන්ගේ මහා සතර සිහිවටන ගීත කාව්‍යට නගමින් සංගිත විශාරද ජගත් වික්‍රමසිංහ සූරින් සංවත්සරික උළෙල ප්‍රබෝධමත් කල අතර නර්තන අංගයන්ගෙන් ද එය වඩාත් ප්‍රභාමත් වුනි. තේ පැන් සංග්‍රහයෙන් අනතුරුව, උළෙලේ විශේෂ අංගය වු තිබ්බතයෙන් වැඩම කරන ලද ලාමා මාමා තුමන්ගේ දේශනය ආරම්භ වුනි. මෙම සුවිශේෂී දේශනය ඉතා වැදගත් කරුණු සමුහයක් හෙළි කල අතර වඩාත් වැදගත් වුයේ බුදුරජාණන් වහන්සේගේ ලංකා ගමනය සාක්‍ෂය කොට ගත් කරුණු හෙලිවිමයි. උන් වහන්සේගේ කථාවේ අසංක්ෂිප්ත පරිවර්තනයක් 11-14 පිටුවල මුද්‍රණය කර ඇත. හිමාලයේ සංචාරවල යෙදී ඇති අතිපූජ්‍ය මිස්සක ස්වාමීන්දයන් වහන්සේද මෙම සාකච්ඡාවට එක වෙමින් ලාමා තුමාගේ විශේෂ දේශනය සභා තොමොට පැහැදිලි කරවීමට උත්සහ ගත්තේය.

මෛත්‍රී භූෂණ සම්මානලාභීන් වුයේ. ගරුතර අතිපූජ්‍ය හරිස්පත්තුවේ අරියවංශාලංකාර ස්වාමින්ද්‍රයන් වහන්සේත්, හෘද රෝග විශේෂඥ වෛද්‍ය ඩී. පී. අතුකෝරළ මහතා සහ මැලිබන් සමුහ ව්‍යාපාරයේ අධ්‍යක්ෂක දුරන්දර ලක්ෂමන් වීරසූරිය මහතා ඇතුළු බෞද්ධ සංස්කෘතිය සහ එහි චිරස්තිථිය උදෙසාම මෛත්‍රී සහගත ක්‍රියාදාමයක එළඹ සිටින සැබෑ බෞද්ධයින් තිදෙනෙකුටය.






















එම දේශනයට පසු වාර්ෂික මහා සභාවේ වැඩ කටයුතු ආරම්භ වූ අතර දස වසරක මතක සටහන් විද්‍යුත් ප්‍රක්ෂේපන පිළිබිඹු පැමිණි සියල්ලන්ට දක ගන්නට සැලැස්වුනි. පසුගිය වාර්ෂික සමුළුවෙහි වාර්තාව ලේකම් තුසිත දොඹගොඩ මහතා ඉදිරිපත් කල අතර, වැය ශීර්ෂය භාණ්ඩාගාරිකතුමන් වන වාසනා රණසිංහ මහතා සභාව හමුවේ තැබුවේය. ඉන් අනතුරුව ඉදිරි වර්ෂය සඳහා නව නිලධාරි මණ්ඩලය පත්කිරිම සිදු වුනි. නව ලේකම් අජිත් නිශාන්ත මහතාගේ ස්තුති කථාවෙන් අනතුරුව ජාතික ගීය ගායනා කිරීමෙන් හා බෞද්ධයින් ලෙස කරණීය මෙත්ත සූත්‍රය සජ්ජායනයෙන් අනතුරුව සංවත්සර උළෙලෙහි සමාජතිය සටහන් වුනි.



# හිමවතෙහි බුදු දහම සහ ලාංකේය බුදු දහමත් සමග ඇති ඉතිහාසගත මිත්‍රත්වය

තිබ්බතයෙන් වැඩම කරන ලද
ලාමා මාමාතුමන්ගේ දේශනය ඇසුරෙන්
අසංක්ෂිප්ත පරිවර්තනය
**පත්මකුමාර ජයසිංහ**

වර්ෂ 618 සිට 649 දක්වා වූ සොන්ග්සාන් ගම්පො රජුගේ කාලය තිබ්බතයේ ස්වර්ණමය ඉතිහාසයේ ඇරඹුම ලෙස හඳුන්වනු ලැබේ. ඔහු දරුණු පාලකයෙක් වූ අතර ඔහුගේම රාජධානියක් ස්ථාපිත කරමින් මධ්‍යම ආසියාවේ අසහාය අධිරාජ්‍යකු විය. පසු කාලයේදී අමිල බුදුදහමේ ආභාෂයෙන් ඔහු සංවේදී ධාර්මික පාලකයෙකු බවට පත් විය.


ඉන්දියාවේ හිමවත පුර පැතිරී ඇත්තා වූ බුදු දහම "හිමවතෙහි" බුදු දහම ලෙස හඳුන්වයි. ඇත්තෙන්ම එය "මහායානය" සහ වජ්‍රයානය ලෙසත් සමහරු "ලාමා දහම" ලෙසත් හඳුන්වනු ලැබේ. තිබ්බත භාෂාවෙන් ලියා ඇත්තා වූ ධර්ම අත් පිටපත් නිසා මෙය "තිබ්බත බුදුදහම" ලෙස හඳුන්වනු ලැබේ. හිමාලයේ නේපාලය, භූතානය, තිබ්බතය, මොන්ගෝලියාව, රුසියාවේ, නැගෙනහිර ප්‍රදේශ, නැගෙනහිර සහ බටහිර ඉන්දියාවේ අරුනාචල් ප්‍රදේශ්, ධර්මසාලා, ලාහුල්, ස්පිති, සික්කම් සහ ලද්හාක් සහ හිමාලයේ තවත් ප්‍රදේශ වල අමා මෑණී තිලෝගුරු බුදුරජාණන් වහන්සේගේ අති උත්තම ධර්මස්කන්ධය පැතිරී ඇත.

මේ ආකාරයටම සිංහල දීපයේ පැතිරී ඇත්තා වූ ථෙරවාදී  බුදුදහම ලාංකේය බුදුදහම ලෙස හඳුන්වනු ලැබේ.

බුදුරජාණන් වහන්සේගේ කාලයේදීම බුදු දහම දේශ දේශාන්තර වල ප්‍රචලිත විම සිදු වුනත් පසුව එක් එක් කාලවකවානු වල දී රජවරුන්ගේ සහ සිටුවරුන්ගේ (ධනවතුන්ගේ) ආශීර්වදය සහ අනුග්‍රහය මත එය ශක්තිමත් විය. වර්ෂ 618 සිට 649 දක්වා වූ සොන්ග්සාන් ගම්පො රජුගේ කාලය තිබ්බතයේ ස්වර්ණමය ඉතිහාසයේ ඇරඹුම ලෙස හඳුන්වනු ලැබේ. ඔහු දරුණු පාලකයෙක් වූ අතර ඔහුගේම රාජධානියක් ස්ථාපිත කරමින් මධ්‍යම ආසියාවේ අසහාය අධිරාජ්‍යකු විය. පසු කාලයේදී අමිල බුදු දහමේ අභාෂයෙන් ඔහු සංවේදී ධාර්මික පාලකයෙකු බවට පත් විය. තිබ්බතයේ සංස්කෘතික පදනම සකස් විය යුත්තේ බුදු දහම ඇසුරෙන් බව ඔහු තීරණය කල අතර බුදුන්ගේ දහම ගැඹුරින් හැදෑරිම සඳහා රජු ඔහුගේ දූතයන් බුදු දහමින් සුපෝෂිත අවට දේශයන් වන චීනය, නේපාලය, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව කරා යවන ලදී.



මලයගිරි ප්‍රදේශයේ වැඩ වාසය කල සමන්ත බද්‍ර නම් බෝසත්වරයෙකු අප තිලෝගුරු බුදු රජාණන් වහන්සේට ලංකාවට වැඩම කරන ලෙස ආරාධනා කර ඇති අතර එම ආරාධනාව පිළිගනිමින් උන්වහන්සේ ලංකා භූමියට වැඩම කර මලයගිරියේ කදු මුදුනේ භාග්‍යවතුන් වහන්සේගේ දක්ෂිණ සිරි පතුල පිහිටුවන ලදී. ඉතිහාසගත කරුණුවලට අනුව ලංකා ගමනේදී නාග, යක්ක, මනුෂ්‍ය සහ සමන්ත බෝසතුන් ඇතුළු දේව යන චතුර් වර්ග ලක් වැසියන්ට ධර්මය දේශනා කර ඇත. මෙම ධම්ම දේශනාවන් පසු කලෙක ග්‍රන්තාරූඪ කර ඇති අතර
මලයගිරිය මුදුනෙහි තබා ඇත. දිගු කලෙකට පසු ස්වාභාවික උවදුරු වලින් ඒවා විනාශ වී ඇත. වාසනාවකට පොත් කිහිපයක් එහි වැඩ වාසය කල යෝගිවරුන්ට හමුවී ආරක්ෂාව පිණිස තිබ්බතයට යවන ලදී. එනිසා ලාංකික බුදු දහමට මෙන්ම තාන්ත්‍රික භික්ෂු සම්ප්‍රදායට



ලාංකික දේශයට පැමිණි දූතයා විසින් දූව මුවා පිළිමයක් සමග ධර්ම ග්‍රන්ථ කිහිපයක් ගෙන ගිය බව සදහන් වේ. ලාසා වල තබා ඇත්තා වූ තවමත් හොඳින් ආරක්ෂා වුණු මෙම දූවමුවා පිළිමය අවලෝකිතේශ්වර නාථ බෝසතුන්ගේ වන අතර බැතිමතුන් නිරන්තරව වන්දනාමාන කරයි. මෙම පිළිම වහන්සේ තිබ්බත සංස්කෘතියේ සුවිශේෂී ස්ථානයක් හිමිකර ගනී. එම නිසා ලාංකේය බැතිමතුන් දළදා වහන්සේට ගරු කරන්නාක් මෙන් මෙම පිළිමවහන්සේට ගරු කොට සලකයි. මෙකල්හිම සිංහල වැනි බොහොමයක් විවිධ භාෂිත බෞද්ධ ග්‍රන්ථ තිබ්බත බසට පෙරලෙන්නට විය. එනිසාම තිබ්බතයට අවශෝෂිත බෞද්ධ සාහිත්‍ය කුමක්දැයි නිශ්චිතව නිගමනය කිරීම උගහට වුවත් ඒවා තිබ්බතය පුරා ඇති අතිවිශාල පුස්තකාල වල කොහේ හෝ සුරක්ෂිතව ඇතැයි විශ්වාසයක් පවතී.


ගුරු රින්පෝචේ (හෝ පද්ම සමභව) නැමැති ස්ථවිරයන් වහන්සේ නිසා ලංකාව සහ තිබ්බතය අතර සම්බන්ධය එක් කලෙක නැවත ඇති විය. මෙම ස්ථවිරයන් වහන්සේ හිමාල බුදු දහමෙහි ඉතා ගරු කොට සලකන අතර දෙවැනි බුදුන් ලෙස සලකනු ලබයි. වර්තමානයේ පකිස්තානය ලෙස හදුන්වන උද්දියම නම ප්‍රදේශයේ උන් වහන්සේ උපත ලැබූ අතර මුළු හිමවතම තරණය කර ඇත. ලංකා ගමනේදී ශ්‍රී පාද අඩවියේ එසේත් නොමැති නම් මලයගිරියේ වැඩ වාසය කල භික්ෂූන්ගෙන් භාවනාවන් ප්‍රගුණ කර ඇත. ලංකා ගමනින් පසු උන්වහන්සේ තිබ්බතයට වැඩම කර ඇත්තේ ත්‍රිසෝන්ග් දෙත්සොන් රජුගේ (755-797) ආරාධනාවෙනි. ඒ අවදියේදීම එම රජුම නාලන්දා විශ්ව විද්‍යාලයේ සන්තරක්ෂිත නායක ස්තවිරයන් වහන්සේට තිබ්බතයට පැමිණීමට ආරාධනා කර ඇත. ගුරු රින්පොචේ ස්ථවිරයන් වහන්සේ තිබ්බතයේ බුදු දහම උන් වහන්සේගේ අධ්‍යාත්මික ශක්තියෙන් ස්ථාවර කර ඇත.

තිබ්බතයේ ස්ථාපිත වී ඇති එහි පැරණි නිකායක් වන නියින්ග්මපා නිකාය ලාංකේය බුදු දහමත් හිමාල

බුදු දහමත් අතර තවත් සම්බන්ධයක් පෙන්නුම් කරයි. එම නිකායට අනුව ලංකාවේ මලයගිරි ප්‍රදේශයේ වැඩ වාසය කල සමන්ත බද්‍ර නම් බෝසත්වරයෙකු අප තිලෝගුරු බුදු රජාණන් වහන්සේට ලංකාවට වැඩම කරන ලෙස ආරාධනා කර ඇති අතර එම ආරාධනාව පිළිගනිමින් උන්වහන්සේ ලංකා භූමියට වැඩම කර මලයගිරියේ කඳු මුදුනේ භාග්‍යවතුන් වහන්සේගේ දක්ෂිණ සිරි පතුල පිහිටුවන ලදී. ඉතිහාසගත කරුණුවලට අනුව ලංකා ගමනේදී නාග, යක්ක, මනුෂ්‍ය සහ සමන්ත බෝසතුන් ඇතුළු දේව යන චතුර් වර්ග ලක් වැසියන්ට ධර්මය දේශනා කර ඇත. මෙම ධර්ම දේශනාවන් පසු කලෙක ග්‍රන්තාරූඪ කර ඇති අතර මලයගිරිය මුදුනෙහි තැම්පත් කර ඇත. දිගු කලෙකට පසු ස්වාභාවික උවදුරු වලින් ඒවා විනාශ වී ගොස් ඇතත් වාසනාවකට පොත් කිහිපයක් එහි වැඩ වාසය කල යෝගි වරුන්ට හමුවී ආරක්ෂාව පිණිස තිබ්බතයට යවන ලදි. එනිසා ලාංකික බුදු දහමට මෙන්ම තාන්ත්‍රික භික්ෂු සම්ප්‍රදායට ද මලයගිරිය හෙවත් ශ්‍රී පාදය ඉතා වැදගත් තැනකි.

**ශ්‍රී ලංකික ත්‍රයි නිකායන් ලෙස තිබ්බතයේ නිකායන් සතරකි.**

1. **නියින්ග්මපා නිකාය** - පැරණිම නිකාය ලෙස හඳුන්වයි.
2. **සක්යිපා නිකාය** - සක්යිපා යනු අළු පැහැති බිම යන්නයි. 1073 දී ප්‍රථම ආශ්‍රමය අළු පැහැති බිමෙහි පිහිටුවා ඇත. එනිසා මෙම නිකාය එනමින් හඳුන්වයි.
3. **කග්යියුපා නිකාය** - මුඛ පරම්පරාගතව සූත්‍ර ධර්ම රැගෙන යන නිකාය ලෙස හඳුන්වයි.
4. **ගෙලුග්පා නිකාය** - පීත වර්ණ හිස් වැසුම් පළඳින නිකාය ලෙස හඳුන්වයි.



තිබ්බත බුදු දහමේ ඉතා වැදගත් 'ලංකාවතර සූත්‍රය' ලෙස හඳුන්වන සූත්‍ර ධර්මස්කන්ධය එදා බෝසත් අසුරේන්ද්‍ර රාවණට සහ තවත් බෝසත්වරුන්ටද අරහත් රහතුන්වහන්සේලාට ද දේශනා කරන ලද්දක් යැයි තිබ්බතයන් විශ්වාස කරයි.

මෙලෙස මෙම නිකායවල් භෞතික ලක්ෂණවලට අනුව හැඳින්වුවත් පැහැදිලිව හඳුනාගත හැකි වතාවත් හෝ අනුගමනය කරන සූත්‍ර ධර්ම වල වෙනසක් නොමැත. තිබ්බත බුදු දහමේ ඉතා වැදගත් 'ලංකාවතර සූත්‍රය' ලෙස හඳුන්වන සූත්‍ර ධර්මස්කන්ධය එදා බෝසත් අසුරේන්ද්‍ර රාවණට සහ තවත් බෝසත්වරුන්ටද අරහත් රහතුන්වහන්සේලාටද දේශනා කරන ලද්දක් යැයි තිබ්බතයන් විශ්වාස කරයි. "අරහතුන් දහසයකට වන්දනා " නමින් තවත් ධර්ම පුස්තකයක් තිබේ. මෙහි එකිනෙකට වෙනස් රහත් හිමිවරු දහසය නමක් ගැන සඳහන් වේ. වජිරිපුත්‍ර රහත් තෙර යනු ඔවුන්ගෙන් එක් අයෙක් වේ. වජිරිපුත්‍ර යන්නෙහි අරුත වන්නේ වජ්රිගේ පුතා යන්නයි. මෙම රහතුන් වහන්සේ චාමරයක්ද අතැතිව කෝප වූ ආකාරයට ඉන්නා ඉරියව්වක් ප්‍රතිමා තුලින් පිළිබිඹු වේ. මෙවැනි පිළිම මෙන්ම චිත්‍ර ද තිබ්බත බෞද්ධ පන්සල් වල දැක ගත හැකි වේ. මෙම රහතුන් වහන්සේගෙන් පසු "


'වජිරායනය' යන තිබ්බත බුදු දහම ආරම්භ වූ බව විශ්වාස කරයි. එමෙන්ම මෙම රහතුන් වහන්සේ ශ්‍රී ලාංකිකයෙකු නිසා තිබ්බතයේ බෞද්ධයින් ශ්‍රී ලංකාවට බොහෝමත් ගරු කරනු ලැබේ. පබළු මාලය නම් වූ තවත් ධර්ම පුස්තකයක් පිළිබඳව ද තිබ්බත බුදු දහමේ සඳහන් වේ. එහි සඳහන් වන්නේ බුදු රජුන් ජීවමානව සිටි කාලයේ ශ්‍රී ලංකික දායිකාවක් පිළිබඳවයි. මෙම කතන්දරයට අනුව ඈ කිසි කලෙක බුදු හිමි දැක නොමැත. මෙම කරුණු කාරණා පිළිබඳව අධ්‍යනය කිරීම ඉතා වටිනා බව මගේ හැඟීමයි.


එකොළස්වැනි ශත වර්ෂයේ තිබ්බතයට වැඩම කල ප්‍රථම ශ්‍රී ලංකීක භික්ෂුව වන්නේ ජයබද්‍ර ස්වාමීන් වහන්සේයි. උන්වහන්සේ චීනයට යන ගමනේදි නේපාලයට සහ තිබ්බතයට වැඩම කර ඇත. නේපාලයේ පැරණි පන්සලක හමුවන පුස්ථකයක ශ්‍රී

ලංකාවේ පින්තූරයක් දැකිය හැකි අතර එය මෙම භික්ෂුව ගෙනයන්නට ඇති බව විශ්වාස කෙරේ. එම කාලයේ ම චන්ද්‍රමාලා නම් වූ උපාසික මතාවක් ද තිබ්බතයට ගොස් ඇත. සක්යිපා නිකායේ හෙවජ්රා තන්ත්‍ර වලට අනුව තිබ්බත බෞද්ධයින් ඈ යෝගිනියක ලෙස හඳුන්වයි.

තිබ්බත බුදු දහමත් අතර සම්බන්ධය ශක්තිමත් කරනු වස් ලංකික භික්ෂුවක් වන ආනන්ද සිරි ස්වාමීන්වහන්සේගෙන් ලද සේවය ඉතා වැදගත් වේ. මුන් වහන්සේ බෝධිගයා පන්සලෙහි වැඩ සිටි අතර පසු කලෙක එම පන්සල ආක්‍රමණිකයන් අතින් විනාශයට පත්විය. එහිදී වැඩ සිටි සියලුම භික්ෂුන් පලා ගිය අතර මෙම භික්ෂුව තිබ්බතයට පැමිණ ඇත. උන් වහන්සේගේ මුළු ජිවත කාලසිමාවම සූත්‍ර ධර්ම තිබ්බත භාෂාවට පරිවර්තනය කිරිමට කැප කර ඇත. භාරතයේ කත්මන්ඩු සිට තිබ්බතයේ ලාසා නුවරට යන මාර්ගයේ පිහිටා ඇති සක්යිපා පන්සලෙහි මෙම ධර්ම පුස්ථක තැන්පත් කර ඇත. අතීතයේ බොහෝමයක් තිබ්බත හා ශ්‍රී ලාංකික බෞද්ධයින් දෙරට අතර සංචාරය කිරිමට වැර දරා ඇති අතර එම ගමන සාක්ෂාත් කර ගැනීමට අපහසු වී ඇත්තේ අතර මගදී දරුණ කාලගුණික තත්වයන් හමුවේ ලෙඩ වී මරුමුවට පත්වීම නිසායි.

ශ්‍රී ලංකාවේ වැඩ සිටි ජර්මන් ජාතික භික්ෂුවක් වන නාතිලෝක තෙරුන් වහන්සේ 1906 දී තවත් ශ්‍රී ලංකික තෙරුන් වහන්සේලා දෙනමක් සමඟ තිබ්බතයට වැඩම කිරිම ආරම්භ කලත් පාරිසරික දුෂ්කරතා සහ මුදල් අවහිරතා නිසා එය අවසාන කිරිමට නොහැකි වු තැන සිකීම් වලින් නැවතා දැමුණි.





චීන ජාතික භික්ෂුවක් වන පාහියන් භික්ෂුව වර්ෂ 400 දී ලංකාවට වැඩම කර දුටුරුද්දක තිස්සේ බෞද්ධ ධර්ම ග්‍රන්ථ අධ්‍යනය කර ඒවා විශාල ප්‍රමාණයක් චීනයට ගෙනගිය බව සදහන් වේ. උන් වහන්සේගේ විශ්වාසයට අනුව ලංකාවේ අභයගිරි මහා විහාරය මහායානය මත පදනම් වුවකි. 1930 දී අම්දෝ ගෙන් දුන් චෝපෙල් නම් වූ නිර්මාණශිලි තිබ්බත භික්ෂුව ශ්‍රී ලංකාවට වැඩම කර ශ්‍රී ලංකාවේ හා ඉන්දියාවේ බෞද්ධ සිද්ධස්ථාන පිළිබඳ තොරතුරු ග්‍රන්ථයක් සම්ප්‍රාදනය කර ඇත. අටවෙනි සියවසෙහි නිර්මාණය කරන ලද ලංකාවේ නාලන්දා ගෙඩි ගෙය ලංකාවත් තිබ්බතයත් අතර බෞද්ධ මිතුදම පෙන්වන සංකේතයකි.

කෙසේ වෙතත්, මා හට පැවසීමට ඇත්තේ අප කල යුතු වන්නේ හිමවතෙහි බෞද්ධ ජානතාවත් අතර මිතුදම තවත් ශක්තිමත් කරමින් මනා සම්බන්දයන් ගොඩ නගා ගැනීමයි. අපගේ පැරණි සම්බන්ධකම් විශ්ලේෂණය කරමින් නව යුගයකට යා යුතු වේ. සන්නිවේදනය පුළුල් වෙමින් ද එනිසාම ලෝකය කුඩා වෙමින් ද අද සියලු ලෝකවාසින් එකම ජන කොටසක් බවට පත්වෙමින් පවති. එනිසාම අප සියලු දෙනාටම ඉදිරියේදී තිලෝගුරු බුදු රජාණන් වහන්සේගේ වටිනා ඉගැන්විම් හුවමාරු කර ග ැනීමට හැකි වේ. එය ලෝක ජනතාව ලෙස වගකිම් පිළිබඳ හැගිම් වර්ධනයකර ගැනීමට උපකාරයක් වෙයි. එපමණක් නොව විවිධ ආගමික කල්ලීන් ලෙස බෙදිම ද ඔවුන් එකිනෙකා කෙරෙහි හතුරුකම් කරමින්ද එකම ආගමේ වෙනස් කල්ලී ලෙසද බෙදි වෙන්විම ද පලක් නොමැති දෙයකි. එම නිසා අප සියලු දෙනාහට එකට එකතුවී වැඩ කරමින් හොඳ හිත පතුරුවමින් සහ කරුණාවෙන් යුක්තව කටයුතු කල හැක.

**සියලුම ලෝක සත්වයාහටම සාමය සහ සෞභාගය උදා වේවා !**

## නිවේදන සහ නොමිළයේ පලකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්

මෙත් සවිය සඟරාවේ පළකිරීම සඳහා වන සියලු ලිපිද, දාන-ශිල-භාවනා වැඩසටහන් වලදී දායකත්වය දරන පිංවතුන්ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අත හිත දෙන පිංවතුන්ද සඟරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර A4 ප්‍රමාණයේ කොළවල පමණක් ලියා භාරදිය යුතුය. සාමාජිකයින්ගේ දැන්වීම් නොමිළයේ පලකරනු ලැබේ. කොළ කැබලි හා තුන්ඩුවල ලියා එවන විස්තර අස්ථාන ගත විය හැකි බැවින් ඒ පිළිබදව වග කියනු නො ලැබේ. සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා ලිපිය එවන කවරයේ ද වම්පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තිබිය යුතුය. ඔබගේ ලිපිනය ලියාදීම සඳහා භාවනා වැඩසටහන් වලදී අප විසින් ලබාදෙන ලිපි කවරවලද අංකය සදහන් නොකරන හා වැරදි අංක සඳහන් කරන සාමාජිකයින් බොහෝ දෙනෙකු හමුවී ඇත. මේ අය සඳහා පුවත් සඟරාව තැපැලෙන් නොලැබීයාම පිළිබදව වග කියනු නොලැබේ.

**සංස්කාරක**

## සංසදයේ ලිපි කටයුතු සඳහා මුද්දර පරිත්‍යාග

සංසදයේ ලිපි ගනු දෙනු කටයුතු සඳහා මුද්දර ගාස්තුව ලෙස විශාල මුදලක් වැය කිරීමට සිදුවී ඇති අතර, මෙම සත්කාරය සඳහා මුද්දර පරිත්‍යාග කිරීම කැමති පිංවතුන් හට රු.5/- මුද්දර කැමති ප්‍රමාණයක් පරිත්‍යාග කල හැකිය. මුද්දර10ට වැඩි ඕනෑම ප්‍රමාණයක් පරිත්‍යාග කරන විට සටහන් පොතට ඇතුල් කරනු ලැබේ. මෙත් සවිය සංසදයේ පැවැත්මට හා එහි වර්ධනය සඳහා ඔබගේ ශාසනාලයැති දායකත්වය අගය කරන්නෙමු.

## මෙත් සවිය දුරකථන අංක



මෙත් සවිය තොරතුරු විමර්ශනය කරන විට පරිපාලන නිලධාරී මහතා අමතන්න (0714014467) එම දුරකථන වල බිල්පත් ගෙවනු ලබන්නේ මෙත් සවිය මෛත්‍රී සංසදය විසිනි. අපගේ වෙබ් අඩවිය වන www. Methsawiya.lk මගින් ද තොරතුරු ලබා ගත හැකිය. මීට අමතරව සම ලේකම්වරුන් වන අජිත් නිශාන්ත (0714467272) හා රොෂාන් බොතේජු (0721218094) යන මහත්වරුන්ගේ පුද්ගලික දුරකථන අංකයන් අමතා ද හදිසි තොරතුරු ලබා ගත හැකිය. සංසදයේ සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම පුද්ගලික දුරකථන අංක (0714800800 හෝ 07773093385) මඟින් දහවල් 12.00 -1.00 ත් අතර හෝ රාත්‍රී 9.00-10.00 ත් අතර පමණක් (ඉතා හදිසි අවශ්‍යතාවයක දී ඕනෑම වේලාවක ) සිදුකරන්න (දිනකට දුරකථන පණිවිඩ 30ක් පමණ ලැබෙන නිසා සාමාජික අංකය හා නම පවසා සංක්ෂිප්ත ලෙස ඔබගේ විමසීම් සිදු කරන්නේ නම් මැනවි).

## කොළඹ ජාතික රෝහලේ වාට්ටු සඳහා බුදු පිළිම සහ අසරණ රෝගීන් සඳහා අවශ්‍ය මූලික ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම.

වැල්ලවත්තේ ශ්‍රී විජයාරාමාධිපති අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන්වහන්සේගේ අනුසාසනා පරිදි පැවැත්වෙන ඉහත සත්කාර්යය සඳහා බුදු පිළිම, සුදු රෙදි, සැත්කම් වලදී අන්දවන ඇඳුම්, දත් බුරුසු හා දන්තාලේපන, තුවා, සුදු හෝ පාට සරම්, ඇඳ පොච්චි ඇතුළු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ගරු ස්වාමින්වහන්සේට හෝ කාර්යාලයට පැමිණ භාර දෙන්න.

## නොමිළයේ රෝද පුටු සහ කිහිලි කරු ලබා දීම.

මෙත් සවිය මගින් අසරණ අය සඳහා රෝද පුටු සහ කිහිලි කරු පරිත්‍යාග කිරීමේ වැඩ පිළිවෙලක් දියත් කර ඇත. රෝද පුටු සහ කිහිලිකරු අවශ්‍ය අය වෙත්නම් මෙත් සවිය වෙත ලිඛිතව ඉල්ලීමක් සිදුකල යුතුය. මෙම වැඩසටහන සඳහා රෝද පුටු සහ කිහිලිකරු ලබා දී දායක විමට කැමති පින්වතුන් හට එම උපකරණ මෙත් සවිය වෙත ලැබෙන්නට සලස්වන ලෙස මෙත්සිත් පෙරදැරිව ඉල්ලා සිටිමු.

# මෙත් සවිය මෛත්‍රී සංසදය සාමාජික අයදුම්පත

**(ඡායා පිටත්ද භාරගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන් රහසිගතව තබා ගනු ලැබේ.)**

1. සම්පූර්ණ නම ............................................................................................................

2. ස්ත්‍රී / පුරුෂ භාවය................ 3. ජාතික හැඳුනුම්පත් අංකය............................................................

(ඡායා පිටපතක් අමුණන්න)

4. උපන් දිනය...................... 5. වයස.................. 6. ආගම..................................................

7. ස්ථිර ලිපිනය.............................................................................................................

.........................විද්‍යුත් තැපැල(e-mail)............................... දුරකථන අංකය.......................................

8. දිස්ත්‍රික්කය...................... 9. විවාහක / අවිවාහක බව.......................................................

10.රැකියාවක් කරන්නේ නම් ඒ පිළිබඳ විස්තර.....................................................................

.........................................................................................................................

11. කාර්යාලීය ලිපිනය හා දුරකථන විස්තර.........................................................................

12. ලිපි එවිය යුතු ලිපිනය.....................................................................................

13. ලබා ඇති ඉහලම අධ්‍යාපනික සුදුසුකම්

1.........................................................................................................

2.........................................................................................................

14. වෙනත් සංගම් ආදියෙහි සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිලිබඳ විස්තර

1 .........................................................................................................

2 .........................................................................................................

3 .........................................................................................................

15. ඔබ කිසියම් ශාරීරික රෝගයකින් (ඇඳුම,හෘද රෝග,දියවැඩියාව,රුධිර පීඩනය,අපස්මාරය ) පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර

.........................................................................................................

16. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / බෙහෙත් ලබාගෙන තිබේද? ඔව්/නැත.

17. එවැනි මනසික රෝගයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර . .

.........................................................................................................

18. ඔබ විසින් සඳහන් කළයුතු මෙහිදී වැදගත්යැයි හැගෙන වෙනත් විස්තර හෝ යෝජනා /අදහස් තිබේනම් මෙහි සඳහන් කරන්න .........................................................................

.........................................................................................................

මා දන්නා තරමින් ඉහත කරුනණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සාමාජිකත්වය අවලන්ගු කිරීමට හේතුවක් ලෙස මා පිළිගනිමි.

දිනය.................... අයදුම්කරුගේ අත්සන................................

**කාර්‍යාලීය ප්‍රයෝජනය සඳහා**

සාමාජික අංකය..................................

තේරීම් කමිටුවේ තීරණය

. ..................................... ..............................................

තේරීම් කමිටු සභාපති විධායක ලේකම්


දිනය..................

සැ.යු. මෙම අයදුම් පත සමගම ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශණ/වැඩමුළු/මනස දියුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, දේශණ ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ගාස්තු, පුවත් පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයීම, හැඳුනුම්පත් සැපයීම, තැපල් ගාස්තු, විදුලි ගාස්තු,කාර්යාලීය ගාස්තු හා පරිපාලන නිලධාරී මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන බරපැන පියවා ගැනීම සඳහා රු.1500/-ක මුදල් සාමාජිකත්වය පිරිනැමුවාට පසුව එවිය යුතුය.(එය ඇතුළත්වීමේ ගාස්තුව රු.500/-හා වසර දෙකක සාමාජික ගාස්තු රු. 500/-x2 වශයෙනි) මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදයම් ලබන පවුල්වල අය තම ආදයම් තහවුරුකළ හැකි ලිපි ලේඛන සහිත ග්‍රම නිලධාරීතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තු ඉවත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලුම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත්තාට පසුව කාර්යාලයට පැමිණ සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ.) කාර්යාලය සඳුද, අගහරුවාද හැර සතියේ ඉතිරි දින 5 තුල සෙනසුරාද, ඉරිද ද ඇතුලුව සතියේ දින 5ක් විවෘත්තව පවතී. අයදුම් කරන සෑමකෙනෙක්ම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනීමට හේතුව දැනගැනීමට අවශ්‍ය නම් අයදුම්පත් විමර්ශනය සඳහා වන ඇතුලත්වීමේ ගාස්තු ගෙවිය යුතු වන්නෙය.

*නිසිපරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජාතික හැඳුනුම්පතේ ඡායාපිටපතක් සහ 4"×9" ප්‍රමාණයෙන් යුතුව ලිපිනය ඇති මුද්දරකවර 2 ක් සමග පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් යොමු කරන්න.*

*(අයදුම්පත සමග කිසිදු මුදලක් හෝ චෙක් පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ)*


*ලිපිනය-ගරු ලේකම්, මෙත්සවිය, ශ්‍රී විජයරාමය, පෙම්රිකා පාර, කොළඹ 6. දුරකථනය 0714-014467*


හෙළදිවට බුදුහිමි වැඩමකර
වසර 2600 ක් සපිරීම නිමිති කොට
2012/01/08 වන දුරුතු පොහෝ
දින ඓතිහාසික මහියංගන
රාජමහා විහාර පුද බිමෙහි
අඩි 84 ක් උසැති
බුද්ධ ප්‍රතිමා වහන්සේ
නෙළීම මෙත් සවිය විසින්
අරඹන ලදී.
ඇස්තමේන්තු ගත මුදල
රුපියල් ලක්‍ෂ 400 ක්
පමණ වේ
මෙම අටමහා
කුසල කර්මයට
ඔබත් දායක වීමට
කැමති නම් විමසන්න
තනනු ලබන
බුදු පිළිමයේ ආකෘතිය
මෙත් සවිය, මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය, ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ 06.
දුරකථන: 071 40 144 67/011 250 50 88 Web: www.methsaviya.lk, www. methsaviya.org



## මෙත්සවිය දසවන සංවත්සරය වෙනුවෙන්

26.05.2013 දින පැවැති ලේ දන්දීම, අක්ෂි සහ වෛද්‍ය සායනය











**මෙත්සවිය ශ්‍රී විජයාරාමය, ෆෙඩ්‍රිකා පාර, කොළඹ 06**

දුක: 071 4014467 / 0112 505088 වෙබ් අඩවිය: www.methsaviya.lk විද්‍යුත් තැපෑල: methoffice@gmail.com



සැකසුම සහ මුද්‍රණය - **නියෝ ග්‍රැෆික්ස්**, 571/1 උඩහමුල්ල දුම්රියපොළ පාර, ගංගොඩවිල පාර, නුගේගොඩ. දු.ක 2 820 220